ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/01/පොදු-covid19/2020 | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date: 2021.01.26 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්,(පාලන/පිරිස්/මුදල්/ඉංජිනේරු සේවා/සැලසුම්)
ලේකම්, (ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා) අමාත්‍යාංශය
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.
දකුණු පළාත.

**Covid – 19 වසංගත රෝග තත්වය යටතේ නිරෝධායනය වන නිලධාරීන් සඳහා විශේෂ නිවාඩු ලබා දීම**

දැනට රට තුළ පැතිරී යන Covid – 19 වසංගත රෝග තත්ත්වය යටතේ යම් නිලධරයෙකු Covid – 19 රෝගියෙකු වීම මත, රෝගී පුද්ගලයෙකුගේ ආශ්‍රිතයෙකු වීම මත, තම ප්‍රදේශය අගුළු දැමීමකට (Lockdown) පත්කර ඇති අවස්ථාවක හෝ ඒ සම්බන්ධ හේතුවක් මත යම් නිලධරයෙකු හට නිරෝධායනය වීමට සිදු වුවහොත් එම නිරෝධායනය වන නිලධාරීන් සඳහා නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 13:1:2 උප වගන්තිය අනුව විශේෂ නිවාඩු ලබා දීමට හැකි ය.

02. ඒ අනුව නිරෝධායන තත්ත්ව යටතේ නිවාඩු ලබා ගන්නා කාල සීමාව සඳහා අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගෙන් ලිඛිත තහවුරුවක් ලබා ගත යුතු අතර එම සහතිකය ඉදිරිපත් කළ පසුව, විශේෂ නිවාඩු අනුමත කිරීමට කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

03. මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන ද දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**ආර්.සී.ද සොයිසා**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119010, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"